චක්‍රලේඛ අංක : 10 /2023

WPCEC/MA 01/ චක්‍රලේඛ
සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක 628 ,
ජනජය සිටි ගොඩනැගිල්ල,
8 වන මහල , නාවල පාර ,
රාජගිරිය.
2023.12. 12

බස්නාහිර පළාතේ,
සියළුම වි.සේ.ස. සමිති,
දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගම්,
සමුපකාර ණය දෙන සමිති,
දිස්ත්‍රික් සමුපකාර මණ්ඩල හා
අනෙකුත් සියළුම ලියාපදිංචි සමුපකාර සමිති සභාපතිවරුන් වෙත.

සමුපකාර සේවක කොමිෂන් සභා රෙගුලාසි වල 135 වන වගන්තිය යටතේ කෙරෙන අභියාචනා

1994 අංක 01 දරණ සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ 11. ළ වගන්තිය යටතේ සමිතියක සේවකයෙකු සම්බන්ධයෙන් අවශ්‍ය ලිපිගොනු ලේඛණ හෝ වෙනත් තොරතුරු නිශ්චිත දිනයකට පෙර සපයන ලෙස දැනුම් දීමේ බලතල කොමිෂන් සභාව සතුව පවතී.

02. ඒ අනුව සමුපකාර සේවක කොමිෂන් සභා රෙගුලාසි මාලාවේ 135 වැනි වගන්තිය යටතේ කොමිෂන් සභාවට ඉදිරිපත් කෙරෙන අභියාචනා සම්බන්ධයෙන් දින 14 ක් ඇතුලත තම නිරීක්ෂණ ද සමඟින් අදාල ලේඛණ ඉදිරිපත් කල යුතු බවට 5 / 99 චක්‍රලේඛය මඟින් දැනුම් දී තිබුණද එම ලියවිලි සමිති විසින් ප්‍රමාද වී ඉදිරිපත් කරනු ලබන බව කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත.

03 මෙසේ ප්‍රමාද වීමෙන් අභියාචනාකරුවන් හට සිදුවන අගතිය පිළිබඳව අවධානය යොමු කරන ලද කොමිෂන් සභාව නියමිත දිනය ඉක්මවීමෙන් පසුව, කොමිෂන් සභාව සතුව පවතින තොරතුරු භාවිතයට ගනිමින් අභියාචනා විභාග කිරීමට අදාල ඉදිරි කටයුතු කරගෙන යාමට තීරණය කර ඇත.

කොමිෂන් සභා නියමය පරිදි

එස්.ජේ.ජයසිංහ.
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව
බස්නාහිර පළාත

පිටපත් : 1. ලේකම් පළාත් මාර්ග ප්‍රවාහන සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය (බ.ප. ) - කා.දැ.ගැ.පි.
2. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමිති රෙජිස්ට්‍රාර් (බ.ප.) - කා.දැ.ගැ.පි.